ලේඛකයා හා ලේඛකය

ලේඛණ කලාව යනුවෙන් හඳුන්වන්නේ, මිනිසුන් දන්නා හෝ නොදන්නා සිදුවීම් පාඨකයා වෙත ලියා ඉදිරිපත් කිරීමකි. මෙම සිදුවීම්, අතීතයේ සිදු වූ, වර්තමානයේ සිදුවෙමින් පවතින හෝ අනාගතේ සිදුවිය හැකි, සිද්ධීන් විය හැක. එය පාඨකයා අතට පත්කෙරෙන මාධ්‍ය 'පුවත් පත් හා සඟරා'ද වන්නේය.

ලේඛකයකු ළඟ තිබිය යුතු වැදගත්ම ලක්ෂණය වන්නේ 'කුතූහලය' යි. මෙම කුතූහලය නිසාම, තම වටපිටාව නිරීක්ෂණය කිරීම හා එහි සිදුවන සිදුවීම් ගැන සොයා බැලීමෙන්, මොවුන් අතින් නිතැතින්ම සිදුවේ.

'Curiosity Killed the cat' යනුවෙන් ඉංග්‍රීසියෙහි කියමනක් තිබේ. බළලුන් දෙස හොඳින් බැලුවහොත් පෙනෙන්නේ, උන් සෑම දෙයක්ම කුතූහලයෙන් පරීක්ෂා කරන සතුන් කොටසක් බවයි. කුතූහලය, බළලා නෑසුබවක් පවසන්නේ මේ නිසාය. මෙම කියමනෙහි සරල අර්ථය නම්, පරීක්ෂාවේ දී ප්‍රවේශම් වියයුතු බවය. එහෙත්, මෙම කියමන කිවූ තැනැත්තාට අමතක වූ වැදගත් කරුණක් ඇත්තේය. ඒ බළලකුට ජීවිත නවයක් ඇති බවය.

ලේඛකයෙකුගේ වගකීම වනුයේ, තමන්ගේ ලිපියෙන් ඉදිරිපත් කරන, කරුණු කෙටියෙන්, නිරවුල් ලෙසත්, රසවත් ලෙසත් පාඨකයාට ඉදිරිපත් කිරීමය. කීමට ඇතිදේ වටරවුමෙන් කීමට යෑම, බෙල්ල වටා අත යවා නාසය ඇල්ලීමට දරන උත්සහයට සමානය. මෙහිදී සිදුවන්නේ ලේඛකයා පඹගාලක පැටලී, පාඨකයාද එහි පැටලවීමකි. මෙසේ නොකිරීමට නම් ලේඛකයා බුද්ධිමත් අයකු විය යුතුය.

ලේඛකයකු හට කරුණු සොයාගත හැකි ක්‍රම තුනකි. සාකච්ඡා මාර්ගයෙන්, පරීක්ෂා කර බැලීමෙන් (දැකීමෙන් හෝ ඇහුම්කන් දීමෙන්) හා පොත්පත් කියවීමෙන්ය. මේ ක්‍රම තුනෙන් ලැබෙන ඕනෑම පුවතක් ලේඛකයකු හට වාර්තා කළ හැක.

මෙසේ කරුණු සෙවීමේදී, ලේඛකයකු සිතිය යුත්තේ, තමා අතීත ගවේෂණයකට සහභාගි වන බවය. ඉතා කුඩා දෙයක් ලෙස පෙනුණද, මෙම ගවේශණ මගින්, ඉතා විශාල ප්‍රවෘත්ති අනාවරණය කරගත් අවස්ථා එමට නිසාය.

ලිවීම සඳහා 'ගැහැණිය' බඳු මාතෘකාවක්, මේ මිහිපිට තවත් නැත්තේය. ගැහැනිය ගැන, එදා සිට අද දක්වා ලියැවුණු පොත්පත් අප්‍රමාණය. කවි හා ගී ප්‍රබන්ධ අනන්තය. මීට හේතුවන්නේ පිරිමින් මෙන්ම ගැහැණුන්ද, 'ගැහැණිය' යන මාතෘකාව ඉතා ප්‍රිය කිරීම නිසාය. කෙසේ වෙතත්, ගැහැණිය ගැන ලිවීමේදී ඉතා ප්‍රවේශම් විය යුතුය. සුළු ප්‍රමාද දෝශයකින් පවා ගැහැණිය සිත්තැවුල් ඇතිකරගන්නා නිසාය. කෝපවන නිසාය.

"Hell hath no fury like a women Scorned" යැයි ලියවෙන්නට ඇත්තේ මේ නිසා විය හැක. මේ කියමන සඳහන් වනුයේ, William Congreve (1670-1729)ගේ "The Mourning Bride" නැමැති ග්‍රන්ථ යේ ය. මෙතැනදී කථා කරනුයේ, ප්‍රේමයෙන් බැට කෑ ගැහැණියක පිළිබඳවය. ගැහැණියකගේ ආදරයම, වෛරයට පෑරීම නිසා ඇය, භයානක, නපුරු තැනැත්තියක වන බවය. ප්‍රේම සම්බන්ධතා උඩම නොවුනත් ගැහැණිය මෙම තත්වයට ගෙන ඒම ඉතා පහසු නිසා, ඇය පිළිබඳව ලිවීමේ දී, ලේඛකයා අනිවාර්යයෙන්ම ප්‍රවේශම් විය යුතුය.

ලේඛකයතු සිහිතබා ගතයුතු තවත් කරුණක් නම්, තමාගේ පාඨකයා මනාව හඳුනා ගැනීමය. ඔවුනට අව්‍යවන්නේ කුමක්දැයි සොයාබැලීමය. ඉන්පසු, ලේඛකයා, අනෙකුත් අය ලියන ඒකාකාරී ස්වරූපයෙන් මිදී, වෙනස් අයුරකින් සරල ලෙස එය පාඨකයාට ඉදිරිපත් කළ යුතුය. පාඨකයාට අවශ්‍යවන්නේ පිළුණු අදහස් නොවේ. නැවුම් අදහස් ය. එයද සිත කාවදින ශෛලයකින් ඉදිරිපත් කළ යුතුය.

ලිවීමේදී, තමාට ලැබිය හැකි ප්‍රතිචාර ගැනද, ලිවීමට පෙර කල්පනාකර බැලිය යුතුය. එකම සිදුවීමක්, දෙදෙනෙකුට පෙනෙනුයේ දෙවිදියකට නිසාය. සමහරුනට, මොනදේ ලිවත්, ඇදට පෙනෙන අවස්ථා එමට නිසාය. ඒ නිසා සමහර විට, ලැබෙන ප්‍රතිචාර භයානක වියහැක.

එහෙත් ලේඛකයින් 'නිර්භීත' කොටසක් නිසා, ඔවුන් කරනුයේ තමන් දකින අසන, කියවන දෑ පාඨකයා හට ඒ අයුරින්ම ඉදිරිපත් කිරීමය. තමාගේ ලිපියකට 'ප්‍රතිචාර' ලැබෙනවිට, ලේඛකයන්ට දැනෙන ප්‍රීතිය සසඳනුයේ, වඩුවකු පුටුවක් සෑදීමේදී ඔහුට දැනෙන ප්‍රීතියට සමානය. වඩුවකු, ඇණයකට මිටියකින් ගැසීමේදී ලබන වින්දනය මෙහිදී ලේඛකයකුට ලැබෙන බවක්ද සඳහන්වේ.

"No story is worth the risk" යනුවෙන් ද කියමනක් වේ. 'අවදානමට ලක්වේ නම් කිසිම කථාවක් නොවටී' යන්න මෙහි අදහස වුවත්, බොහෝ ලේඛකයින් හඬායන්නේ, මෙම 'අවදානම' පසු පස්සේමය.

බොහෝවිට අප යමෙකු පිළිබඳව විස්තරයක් කරන අවස්ථාවේම ඒ පුද්ගලයා එතැනට ඒම, ඉංග්‍රීසියෙහි විස්තර කරන්නේ

"Talk of the devil and he's presently at your elbow" යනුවෙනි. මෙය කථාවට පමණක් නොව ලිවීමටද අදාළය. මොනවා ලීවද, එතනත් හෙනහුරෙක් ඇත්තේය.

"තොප්පි දාගන්නේ, ඒවා තමාට සරිලනවා නම්...."

නැත්නම්

"If the cap fits"

යනුවෙන් කථාවක් සෑදී ඇත්තේද කුමක් ලීවද එය තමාට එල්ල කරන ලද චෝදනාවකැයි සිතනා පිරිසකුත් ඉන්නා නිසාය. එහෙත් ඒවාට ද පිළිතුරක් ඇත්තේය. ඒ, 'යකාට බය නම්, සොහොනේ ගෙවල් සාදන්නේ නැත.' යන්නය.

අපේ පැරැන්නෝ, "යුද්ධයට

මොනවා ලීවද, එතනත් හෙනහුරෙක් ඇත්තේය.

"තොප්පි දාගන්නේ, ඒවා තමාට සරිලනවා නම්...."

නැත්නම්

"If the cap fits"

යනුවෙන් කථාවක් සෑදී ඇත්තේද කුමක් ලීවද එය තමාට එල්ල කරන ලද චෝදනාවකැයි සිතනා පිරිසකුත් ඉන්නා නිසාය. එහෙත් ඒවාට ද පිළිතුරක් ඇත්තේය. ඒ, 'යකාට බය නම්, සොහොනේ ගෙවල් සාදන්නේ නැත.' යන්නය.

අපේ පැරැන්නෝ, " යුද්ධයට නැති කඩුව, කොස් කොටන්නදැයි" ඇසුවෝය. මෙම කථාවම පෑනටත් අදාළ කළ හැක.....

නැති කඩුව, කොස් කොටන්නදැයි" ඇසුවෝය. මෙම කථාවම පෑනටත් අදාළ කළ හැක.

'ලිවීමට නොගන්නා පෑන කුමකටදැයි' කියාය.

හේමමාලා හේරත්